# ප්‍රසම්පාදන දැන්වීමයි
# මීගමුව මහ නගර සභාව

**" මීගමුව මහා නගර සභා බල ප්‍රදේශයේ තලාහේන හා බසාර් II කොට්ඨාශවල කැලි කසළ ඉවත් කිරීම හා බසාර් II කොට්ඨාශයේ කාණු පිරිසිදු කිරීම "**

ඉහත විස්තර වන ප්‍රදේශවලින් කැලි කසල ඉවත් කිරීම හා ඒ සම්බන්ධ කාර්යයන් ඉටු කිරීමට වසර 1ක කාලයක් සඳහා පළපුරුද්ද හා අදාල සුදුසුකම් ඇති ලියාපදිංචි ආයතන වලින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් **2025.11.25** දින ප.ව.2.00 දක්වා මා විසින් භාර ගනු ලැබේ.

**01. ටෙන්ඩර් විස්තර**

I. මෙම ටෙන්ඩරය වසර 01 ක කාලයක් සඳහා වලංගු වේ.

II. ටෙන්ඩර් පෝරම ගාස්තු (ආපසු නොගෙවන) රු. 5000.00 හා අදාළ බදු මුදල්ද, ටෙන්ඩර් ඇප තැන්පත් ගාස්තු (ආපසු ගෙවන) මුදලින් රු 600,000/- ක් හෝ එම වටිනාකමකින් යුතු දින 90ක කාලසීමාවක් සඳහා වලංගු බැංකු ඇපකරයක් හෝ ඉදිරිපත් කල යුතුය.

III.

| | |
|---|---|
| ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම | 2025.11.24 දින ප.ව. 3.00 දක්වා |
| ටෙන්ඩර් පෝරම භාර ගැනීම | 2025.11.25 දින ප.ව 2.00 දක්වා |
| ටෙන්ඩර් විවෘත කිරීම | 2025.11.25 දින ප.ව 2.05ට |

IV. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර මිල ගණන් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ " කැලි කසළ ඉවත් කිරීම සඳහා මිල ගණන් " ලෙස සඳහන් කළ යුතුය.

**02. සුදුසුකම්**

I . බස්නාහිර පළාත් සභා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුයි.

II. ඝන අපද්‍රව්‍ය රැස් කිරීම හා ප්‍රවාහනය කිරීම පිළිබඳ හැකියාව ඇති ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදවීමට හැකියාව තිබිය යුතුයි.

III. ඝන අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට හැකියාව ඇති ප්‍රමාණවත් ට්‍රැක්ටර් සංඛ්‍යාවක් තිබිය යුතුයි.

IV. නාගරිකයේ බසාර් II කොටසේ කසල බැහැර කිරීම සඳහා කම්පැක්ටර් රථ පමණක් යොදා ගැනීමේ හැකියාව තිබිය යුතුයි.

V. ඝන අපද්‍රව්‍ය රැස් කිරීම හා ඒවා ප්‍රවාහනය කිරීම සම්බන්ධව පෙර සුදුසුකම් ඉදිරිපත් කර ඇති අය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

03. වැට් බදු යටතේ ලියාපදිංචි වී ඇත් නම් ටෙන්ඩරයේ පිටපත් දෙකෙහිම අදාළ වැට් අංකය හා මුදල පැහැදිලිව සඳහන් කළ යුතුය.

04. පිටපත් දෙකකින් යුක්තව මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 2025.11.25 දින පව 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එසේ නැතහොත් නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

05 ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී එහි මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම ලියුම් කවරවල බහා ( මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර) මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය

06 ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මෙම සභාව සතුවේ. ටෙන්ඩර් සම්බන්ධව මීගමුව මහ නගර සභාවේ තීරණය අවසන් තීරණය වේ .

07 ජයග්‍රාහී ටෙන්ඩර්කරු තෝරා ගැනීමෙන් අනතුරුව ටෙන්ඩරය පිරිනැමීමට පෙර මීගමුව මහා නගර සභාව සමඟ ගිවිසුමකට එළඹිය යුතුවේ.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුට හෝ ඔහුගේ ලිඛිත අවසරයලත් නියෝජිතයෙකුට පමණක් පෙනී සිටිය හැක. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී නාගරික සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් විමසා දැනගත හැක.

**දුරකථන අංකය :- 031 - 2222262**

නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
මීගමුව.

**2025.11.10** දින,
මීගමුව නාගරික කාර්යාලයේදී.